# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 16 දරන ද්‍රවිඩ ලංකා විමුක්ති කොටි හා වෙනත් සමාන සංවිධාන තහනම් කිරීමේ පනත

1978-6-2

[සහතිකය සටහන් කළේ 1978 මැයි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 මැයි මස 26 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 45 යි    තැපැල් ගාස්තුව: ශත 15 යි

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 16 දරන ද්‍රවිඩ ලංකා විමුක්ති කොටි හා වෙනත් සමාන සංවිධාන තහනම් කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1978 මැයි මස 23 වන දින]

එල්.ඩී.—ඔ. 40/78

ද්‍රවිඩ ලංකා විමුක්ති කොටි නමැති සංවිධානය තහනම් කිරීම පිණිස ද ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීමට සාහසික ක්‍රියා උපයෝගී කර ගනු ලබන්නා වූ වෙනත් යම් සංවිධානයක පැවැත්ම රාජ්‍යයේ ආරක්ෂාවට හානිකර වන්නේ ද, එවැනි වෙනත් සංවිධාන තහනම් කිරීමට විධිවිධාන සැලැස්වීම පිණිස ද, එවැනි යම් සංවිධානයක් සහ එවැනි සංවිධානයකට සම්බන්ධ තැනැත්තන් විසින් කරනු ලබන නීති විරෝධී කටයුතු සාර්ථක ලෙස වැළැක්වීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

පූර්විකාව.

ද්‍රවිඩ ලංකා විමුක්ති කොටි යනුවෙන් හඳුන්වා ගනු ලබන සංවිධානයක් ජාතියේ එක්සත් බවට හා පූර්ණත්වයට හානි කිරීමෙ කාර්යය සඳහා සාහසික ක්‍රියා උපයෝගී කර ගෙන ඒ මගින් ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව සහ රටේ යථා පැවැත්ම අනතුරට පාත්‍රකොට ඇති හෙයින් ද :

එකී සංවිධානයෙහි අරමුණු ඉටු කර ගැනීමෙහි ලා කරන ලදැයි කියනු ලබන ඇතැම් සාහසික ක්‍රියා දිවයිනේ ඇතැම් ප්‍රදේශවල සිදු කර තිබෙන හෙයින් ද :

එකී ක්‍රියා, ජාතියේ ආරක්ෂාව, මහජන ආරක්ෂාව සහ රටේ යථා පැවැත්ම අනතුරට පාත්‍රකොට ඇති හෙයින් ද :

එකී සංවිධානය තහනම කිරීම පිණිස සහ සාහසික ක්‍රියාවල යෙදීම උපයෝගී කර ගනු ලබන්නාවූ ද, ස්වකීය ක්‍රියා ජාතියේ එක්සත් බවට හා පූර්ණත්වයට, ජාතියේ ආරක්ෂාවට, මහජන ආරක්ෂාවට සහ රටේ යථා පැවැත්මට හානිකර වන්නාවූ ද වෙනත් සංවිධාන තහනම් කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම අවශ්‍යව ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මෙ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 16 දරන ද්‍රවිඩ ලංකා විමුක්ති කොටි හා වෙනත් සමාන සංවිධාන තහනම් කිරීමෙ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ද්‍රවිඩ ලංකා විමුක්ති කොටි නමැති සංවිධානය තහනම් කිරීම සහ ඒ හා සමාන වෙනත් සංවිධාන තහනම් කිරීමට ජනාධිපතිවරයාට ඇති බලය.

**2.** (1) ද්‍රවිඩ ලංකා විමුක්ති කොටි යනුවෙන් හඳුන්වනු ලබන සංවිධානය මෙයින් තහනම් කරනු ලැබේ.

(2) වෙනත් යම් සංවිධානයක් විසින් සාහසික ක්‍රියාවල යෙදීම උපයෝගී කර ගනු ලැබේ යයි ද එය කෙළින් ම හෝ අන් අයුරකින් නීති විරෝධී කටයුතුවලට සම්බන්ධ යයි නැතහොත් නීති විරෝධී කටයුතුවල යෙදී සිටිතැයි ද ජනාධිපතිවරයාගේ මතය වුවහොත් ඔහු විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ඒ සංවිධානය තහනම් සංවිධානයක් යයි ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(3) මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ යම් සංවිධානයක් තහනම් කරනු ලබන හෝ තහනම් කර ඇති අවස්ථාවක, තහනම් කරන ලද සංවිධානය විසින් කර ගෙන යනු ලබන හෝ කලින් කර ගෙන ගිය කටයුතුවලට සාරානුකූල ව සමාන කටයුතුවල නිරතව සිටින වෙනත් සෑම සංවිධානයකට ම මේ පනතේ විධිවිධාන, ඒ සංවිධානය ද තහනම් කරන ලද සංවිධානයක් වූවාක් මෙන් ඒ ආකාරයෙන් ම අදාළ විය යුතු ය.

2 (2) වන වගන්තිය යටතේ කරන ලද නියමයන්ට අදාළ විධිවිධාන.

3. (1) 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කරන ලද සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි සිට ක්‍රියාත්මක විය යුතු අතර, එය අවසාන හා තීරණාත්මක ද විය යුතු ය ; තව ද එය කිසිම අධිකරණයක දී රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(2) ඒ සෑම නියමයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එවැනි යම් නියමයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු දින තිහක කාලයක් ඇතුළත ජාතික රාජ්‍ය සභාවේ (නොපැමිණි මන්ත්‍රීවරයන් ඇතුළුව) සම්පූර්ණ මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකොටසක්වත් විසින් පක්ෂව ඡන්දය දීමෙන් අනුමත නොකරනු ලැබූ අවස්ථාවක, ඒ නියමය ජාතික රාජ්‍ය සභාව විසින් කලින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් මිස නැතහොත් කලින් අනුමත නොකරනු ලැබුවහොත් මිස දින තිහක් ඉකුත් වූ විට ක්‍රියාත්මකවීම අවසන් විය යුතු ය.

(3) ඒ නියමය ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත නොකරනු ලැබ ඇති අවස්ථාවක, පළමු නියමයේ දින සිට දින එකසිය අසූවක් ඉකුත්වීමට පෙර ඒ සංවිධානය සම්බන්ධයෙන් කරනු ලබන කිසිම තදනන්තර නියමයක්, ඒ නියමය ඉහත දැක්වෙන ආකාරයෙන් ම ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලබන තුරු, ක්‍රියාත්මක නොවිය යුතු ය.

(4) ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ සෑම නියමයක් ම ජනාධිපතිවරයා විසින් හෝ ජාතික රාජ්‍ය සභාව විසින් හෝ කලින් ප්‍රත්‍යාදිෂ්ට නොකරනු ලැබුවහොත් ඒ නියමයේ දින සිට එක් අවුරුද්ද කාලයක් වලංගුව බලපැවැත්විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වූ නියමයක් අනුමත කිරීම, අනුමත නොකිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ පිළිබඳ දැන්වීම හැකි පහසු ඉක්මනින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

වැරදි.

4. මේ පනතින් හෝ එය යටතේ හෝ යම් සංවිධානයක් තහනම් කරනු ලබන හෝ තහනම් කරනු ලැබ ඇති හෝ අවස්ථාවක,—

(අ) ඒ සංවිධානය හා සමග යම් සම්බන්ධයක් හෝ එහි සාමාජිකත්වය හෝ එයට බැඳීමක් දක්වන්නා වූ හෝ පෙන්නුම් කරන්නා වූ යම් නිල ඇඳුමක්, ඇඳුම් කට්ටලයක්, සංකේතයක් හෝ වෙනත් ලාංඡනයක් පළදින්නා වූ ; හෝ

(ආ) ඒ සංවිධානයේ රැස්වීමක් කැඳවන්නා වූ හෝ ඒ සංවිධානයෙහි හෝ එයට සම්බන්ධ වූ හෝ අදාළ වන්නා වූ යම් කටයුත්තකට සහභාගි වන්නා වූ හෝ අනුයුක්ත වන්නා වූ ; හෝ

(ඇ) ඒ සංවිධානයට සාමාජිකයන් කැඳවීමෙන් හෝ බඳවා ගැනීමෙන් හෝ දායක මුදල් ගෙවීමෙන් හෝ මුදල් එකතු කිරීමෙන් හෝ තොරතුරු සැපයීමෙන් හෝ වෙනත් සහාය අත්කර දීමෙන් හෝ ඒ සංවිධානයට ආධාර කරන්නා වූ ; හෝ

(ඈ) යම සාමාජිකයකු අල්ලා ගැනීම, ඔහුට විරුද්ධව නඩු විභාග කිරීම හෝ ඔහුට දඬුවම් පැමිණවීම වැළැක්වීමේ, එයට බාධා කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් මැදිහත්වීමේ චේතනාවෙන් ඒ සංවිධානයේ යම සාමාජිකයකු රැකවරණ කරන්නා වූ, සඟවාගෙන සිටින්නා වූ හෝ වෙන යම ආකාරයකින් එබන්දකුට සහාය වන්නා වූ ; හෝ

(ඉ) ඒ සංවිධානය විසින් හෝ වෙනුවෙන් හෝ එහි යම සාමාජිකයකු විසින් හෝ පළ කරනු ලැබූ හෝ පළ කරනු ලැබේ යයි අදහස් වන්නා වූ යම ලිඛිත හෝ මුද්‍රිත දෙයක් සකස් කරන්නා වූ, මුද්‍රණය කරන්නා වූ, බෙදහරින්නා වූ හෝ පළ කරන්නා වූ හෝ එබන්දක් සකස් කිරීමෙහි ලා, මුද්‍රණය කිරීමෙහි ලා, බෙදාහැරීමෙහි ලා හෝ පළ කිරීමෙහි ලා යම ආකාරයකින් සම්බන්ධ වන්නා වූ ; හෝ

(ඊ) ඒ සංවිධානය විසින් හෝ එහි යම සාමාජිකයකු විසින් හෝ කරනු ලැබූ හෝ කරනු ලැබේ යයි අදහස් කරනු ලැබූ යම නියමයක, තීරණයක, ප්‍රකාශනයක හෝ උපදේශයක හෝ සංවිධානයට අදාළ යම තොරතුරක් වෙන යම තැනැත්තකුට කවර වූ හෝ ආකාරයකින් නිවේදනය කරන්නා වූ හෝ නිවේදනය කිරීමට තැත් කරන්නා වූ

යම් තැනැත්තෙක් වරදක් කරන්නේ ය.

5. (1) මේ පනතින් හෝ එය යටතේ හෝ යම සංවිධානයක් තහනම් කරනු ලබන හෝ තහනම් කර ඇති අවස්ථාවක— ප්‍රකාශන පාලනය කිරීම.

(අ) නියම බලධරයාගේ ලිඛිත අනුමතය නොමැතිව—

(i) ඒ සංවිධානයේ යම කටයුත්තකට හෝ යෝජිත යම කටයුත්තකට හෝ ඒ සංවිධානය විසින් සිදු කරනු ලැබූ හෝ සිදු කරනු ලැබ ඇතැයි අදහස් කරනු ලැබූ යම ක්‍රියාවකට ;

(ii) ඒ සංවිධානය විසින් සිදු කරනු ලැබූ හෝ සිදු කරනු ලැබ ඇතැයි අදහස් කරනු ලැබූ යම ක්‍රියාවක් හෝ වරදක් හෝ පිළිබඳ වූ විමර්ශනයට

අදාළ වන යම කරුණක් යම ප්‍රවෘත්ති පත්‍රයක මුද්‍රණය කිරීම හෝ පළ කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය ;

(ආ) (අ) ඡේදයේ (i) වන අනුඡේදයෙහි හෝ (ii) වන අනුඡේදයෙහි සඳහන් යම කරුණක් ඇතුළත් වන්නාවූත් ශ්‍රී ලංකාවෙහි දී හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර දී මුද්‍රණය කරන ලද්දවූ හෝ පළ කරන ලද්දවූත් යම ප්‍රවෘත්ති පත්‍රයක් බෙදාහැරීම හෝ බෙදාහැරීමෙහි ලා සම්බන්ධවීම හෝ නියම බලධරයාගේ ලිඛිත අනුමතය නොමැතිව කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි විධිවිධානවලින් යම් විධිවිධානයක් කඩ කරමින් යම් ක්‍රියාවක් සිදු කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

(3) (අ) යම් තැනැත්තකු මෙ වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින් ඒ වරද සඳහා නීත්‍යනුකූලව නියම කළ හැකි යම් දඬුවමකට අතිරේකව, ඒ ආඥාවෙහි නිශ්චිත යම් කාලසීමාවක් තුළ කිසිම තැනැත්තකු විසින් එවැනි යම් ප්‍රවෘත්ති පත්‍රයක් මුද්‍රණය කිරීම, පළ කිරීම හෝ බෙදහැරීම නොකළ යුතු යයි ද, එවැනි යම් ප්‍රවෘත්ති පත්‍රයක් මුද්‍රණය කිරීමෙහි ලා, පළ කිරීමෙහි ලා හෝ බෙද හැරීමෙහි ලා කිසියම් ආකාරයකින් සම්බන්ධ නොවිය යුතු යයි ද ඒ ප්‍රවෘත්ති පත්‍රය මුද්‍රණය කරනු ලැබුවේ යම් මුද්‍රණාලයක ද ඒ මුද්‍රණාලය, ඒ ආඥාවෙහි නිශ්චිත යම් කාලසීමාවක් තුළ කවර වූ හෝ කාර්යයක් සඳහා නැතහොත් ආඥාවෙහි නිශ්චිත යම් කාර්යයක් හෝ සඳහා පාවිච්චි නොකළ යුතු යයි අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(ආ) මෙ වගන්තිය යටතේ යම් වරදක් කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩුවක් පවරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ප්‍රවෘත්ති පත්‍රය මුද්‍රණය කරනු ලැබුවේ යයි කියනු ලබන්නේ යම් මුද්‍රණාලයක ද, ඒ මුද්‍රණාලය, නඩු විභාගය අවසන් වන තුරු කවර වූ හෝ කාර්යයක් සඳහා නැතහොත් ආඥාවෙහි නිශ්චිත යම් කාර්යයක් සඳහා පාවිච්චි නොකළ යුතු යයි අධිකරණය විසින් අතුරු ආඥාවක් කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

6. මෙ පනත යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් යම් වරදක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම හා නිලධරයකු ම ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු ම ; සහ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නොවන සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම්, එහි කළමනාකාරිත්වය හා පාලනය සඳහා වගකිව යුතු ඒ මණ්ඩලයේ සෑම නිලධරයකු ම

ඒ වරදට වරදකරු වශයෙන් සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද තමාගේ දැනුම නොමැතිව ඒ වරද කරනු ලැබූ බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට නියම ලෙස සම්පූර්ණයෙන් ම අනලස්ව තමා ක්‍රියා කළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් එවැනි කිසිම තැනැත්තකු ඒ වරදට වරදකරු වශයෙන් නොසැලකිය යුතු ය.

තහනම් කරනු ලැබූ සංවිධානයක මුදල්, සුරැකුම්පත් හෝ බැර සහ එංවල හා නිශ්චල දේපළ රාජසන්තක විය යුතු බව.

7. (1) මෙ පනතින් හෝ එය යටතේ හෝ යම් සංවිධානයක් තහනම් කරනු ලබන හෝ තහනම් කරනු ලැබ ඇති හෝ අවස්ථාවක, සුදුසු යයි අමාත්‍යවරයා කල්පනා කරන පරීක්ෂණයකින් පසු, ඒ සංවිධානයේ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන මුදල්, සුරැකුම්පත් හෝ බැර කිසිවක් යම් තැනැත්තකු භාරයේ ඇත්තේ යයි අමාත්‍යවරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඒ තැනැත්තාගේ භාරකාරත්වයෙහි ඇති මුදල්, සුරැකුම්පත් හෝ බැර කිසිවක් හෝ, ලිඛිත නියමය කිරීමෙන් පසු ඔහුගේ භාරකාරත්වයට

පත්විය හැකි මුදල්, සුරැකුම්පත් හෝ බැර කිසිවක් සහ ඒ සංවිධානයට අයත් වෙන යම් චංචල හා නිශ්චල දේපළ රාජසන්තක කරනු ලැබිය යුතු යයි ලිඛිත නියමයකින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අමාත්‍යවරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු අතර කිසිම අධිකරණයක දී රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් ප්‍රශ්න නොකරනු ලැබිය යුතු ය.

ඇපදීම පිළිබඳ වූ යම් ලිඛිත නීතියක විධිවිධාන, මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ තැනැත්තන්ට අදාළ නොවිය යුතු බව.

8. වෙන යම් ලිඛිත නීතියක විධිවිධාන කුමක් වුව ද—

(අ) මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් සැක කරනු ලැබූ හෝ, චෝදනා කරනු ලැබූ යම් තැනැත්තකු යම් අධිකරණයක් ඉදිරියෙහි පෙනී සිටින්නා වූ හෝ යම් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලබන්නා වූ අවස්ථාවක, නඩු විභාගය අවසන් වන තුරු ඒ තැනැත්තා රඳවා තබා ගන්නා ලෙස ඒ අධිකරණය විසින් ආඥා කළ යුතු ය ;

(ආ) මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම, තමා වරදකරු කරනු ලැබීමට විරුද්ධව හෝ තමාට නියම කරනු ලැබූ දණ්ඩනයට විරුද්ධව හෝ තමා විසින් අභියාචන පෙත්සමක් ඉදිරිපත් කර ඇත්තේ වුව ද, අභියාචනය තීරණය කරනු ලබනතුරු රිමාන්ඩ් භාරයේ තබනු ලැබිය යුතු ය ;

(ඇ) 5 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන යටතේ කරන ලද යම් ආඥාවක්, ඒ ආඥාවට විරුද්ධව යම් අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තේ වුව ද, ඒ අභියාචනය පිළිබඳව තීරණයක් කරනු ලබනතුරු නවදුරටත් බල පැවැත්විය යුතු ය :

එසේ වුව ද, (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ සඳහන් එවැනි යම් තැනැත්තකු, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන්නා වූ කොන්දේසිවලට යටත්ව ඒ අධිකරණය විසින් විශේෂ අවස්ථාවන්හි දී ඇප පිට මුදා හැරීම හෝ (ඇ) ඡේදයෙහි සඳහන් යම් ආඥාවක් වෙනස් කිරීම හෝ අත්හිටුවීම හෝ කරනු ලැබිය හැකි ය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ ඇතැම් දඬුවම් පිළිබඳ වූ විධිවිධාන, ඇතැම් වැරදි සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ හෝ වරදකරු වූ තැනැත්තන්ට අදාළ නොවිය යුතු බව.

9. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතෙහි කුමක් සඳහන්ව ඇත ද—

(අ) ඒ පනතේ 239 වන වගන්තියේ විධිවිධාන, මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් හෝ යම් අධිකරණයක් ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය ;

(ආ) ඒ පනතේ 250 වන වගන්තියේ විධිවිධාන, මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් හෝ යම් අධිකරණයක් ඉදිරියෙහි වරද පිළිගන්නා හෝ වරදකරු යයි තීරණය කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

වැරදි සම්බන්ධයෙන් දිසා අධිකරණය විසින් නඩු විභාග කළ යුතු බව.

**10.** මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධ නඩු විභාගය දිසා අධිකරණය විසින් පවත්වනු ලැබිය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, ඔහු අවුරුදු හතකට නොවැඩි කාලයක සිරභාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත් විය යුතු ය.

මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ වැරදි කරනු ලැබූ තැනැත්තන් රඳවා ගැනීමට අමාත්‍යවරයා විසින් විධාන කිරීම.

**11.** (1) යම් නීතියක් යටතේ වරදක් කර ඇතැයි නැතහොත් වරදක් කිරීමට සම්බන්ධ වී ඇතැයි ද, එම වරද මේ පනතින් හෝ එය යටතේ තහනම් කරන ලද සංවිධානයක හෝ මේ පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි ඇතුළත් විධිවිධාන අදාළ වන යම් සංවිධානයක පරමාර්ථ හෝ අරමුණු නැතහොත් පැහැදිලි හෝ පෙනී යන පරමාර්ථ හෝ අරමුණු ඉටු කර ගැනීමෙහි ලා හෝ ඒවා වැඩි දුරටත් සාක්ෂාත් කර ගැනීමෙහි ලා නැතහොත් ඒ සම්බන්ධයෙන් හෝ කරන ලදැයි ද විශ්වාස කිරීමට හෝ සැක කිරීමට අමාත්‍යවරයාට හේතු ඇති අවස්ථාවක, ඒ වරද ඒ සංවිධානය තහනම් කිරීමට පෙර හෝ පසුව කරන ලද්දේ වුව ද නොවුව ද ඒ තැනැත්තා පළමුවෙන් මාස තුනකට නො වැඩි කාලයක් තුළ අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන ස්ථානයක එසේ නිර්ණය කරනු ලබන කොන්දේසිවලට යටත් ව රඳවා තැබිය යුතු යයි අමාත්‍ය වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය. එවැනි යම් නියමයක් එක් වතාවකට මාස තුනකට වැඩි නොවන කාලයක් සඳහා කලින් කල දීර්ඝ කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද එවැනි රඳවා ගැනීමක මුළු කාල සීමාව එක් අවුරුද්දකට වැඩි නොවිය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු සම්බන්ධ යෙන් නියමයක් කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන කොන්දේසිවලට සහ, වෙනත් තැනැත්තන් සමග එම තැනැත්තාගේ හැසිරීම, සමාගමය හෝ සංදේශ නය සම්බන්ධයෙන් ඒ විධානයෙහි නිශ්චය කරනු ලබන සීමා කිරීම්වලට යටත් ව ඒ නියමය ක්‍රියාත්මක වීම අත්හිටුවිය යුතු යයි අමාත්‍යවරයා විසින් විධාන කළ හැකි ය :

එසේ වුව ද එවැනි විධානයක්, (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක නිශ්චිත කාලසීමාවට වඩා දීර්ඝ කාල සීමාවක් තුළ බල නොපැවැත්විය යුතු ය.

(ආ) විධානය කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එම තැනැත්තා, නියම කරන ලද යම් කොන්දේසියක් පිළිපැදීම පැහැර හැර ඇති බවට හෝ මහජන ආරක්ෂාවට හානියක් නොමැතිව නියමය ක්‍රියාත්මක වීම තවදුරටත් අත්හිටුවා තැබිය නොහැකි බවට හෝ අමාත්‍යවරයා සෑහීමට පත් වූවහොත් අමාත්‍යවරයා විසින් එවැනි යම් විධානයක් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(3) ඉහත සඳහන් උපවගන්ති යටතේ නියමයක් හෝ විධානයක් කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එම තැනැත්තාට, එම නියමය නැතහොත් විධානය කරනු ලැබුවේ යම් වරදක් හෝ වැරදි සම්බන්ධයෙන් ද ඒ වරද හෝ වැරදි දන්වනු ලැබිය යුතු ය. එම තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් ඒ නියමයට හෝ විධානයට විරුද්ධව උපදේශක මණ්ඩලයට කරුණු ඉදිරිපත් කළ හැකි ය.

12. (1) මේ පනතේ කාර්ය සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත උපදේශක මණ්ඩලයක් විය යුතු ය. උපදේශක මණ්ඩලය.

(2) 11 වන වගන්තියේ විධිවිධාන යටතේ යම් තැනැත්තකු විසින් කරනු ලබන යම් යම් කරුණු ඉදිරිපත් කිරීම් විභාග කොට සුදුස්සක් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් රීති සෑදිය හැකි ය. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයකු පෙර කී පරිදි වූ කරුණු ඉදිරිපත් කිරීම් සලකා බැලීමට පවත්වනු ලබන උපදේශක මණ්ඩලයේ සෑම රැස්වීමක ම මූලසුන දැරිය යුතු ය. එම කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

13. 11 වන වගන්තිය යටතේ වූ නියමයක් කිසිම අධිකරණයක දී රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය. 11 වන වගන්තිය යටතේ වූ නියමයක් කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු බව.

14. මේ පනත යටතේ කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් විධානයක් හෝ ක්‍රියාත්මක කිරීමෙහි ලා නැතහොත් ක්‍රියාත්මක කිරීමෙහි ලා යැයි සැලකීමෙන් සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ආණ්ඩුවට හෝ යම් නිලධරයකුට හෝ තැනැත්තකුට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක්, නඩු පැවරීමක්, නැතහොත් වෙනත් නඩු කටයුත්තක් නොවිය යුතු ය. නිලධරයන් යනාදීන් ආරක්ෂා කිරීම.

15. මේ පනතෙහි විධිවිධාන, මේ පනත ආරම්භ වන දින සිට එක් අවුරුදු කාලයක්, ක්‍රියාත්මක විය යුතු ය. මේ පනත වලංගුව පවත්නා කාලය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

''නියම බලධරයා'' යන්නෙන් මේ පනතේ කාර්ය සඳහා නියම බලධරයකු වශයෙන් අමාත්‍යවරයා විසින් නාමයෙන් හෝ නිලයෙන් හෝ පත් කරනු ලැබූ යම් තැනැත්තෙක් අදහස් වේ ;

''නීති විරෝධී කටයුත්ත'' යන්නෙන් යම් සංවිධානයක් විසින් හෝ සංවිධානයක් වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී කවර වූ හෝ ආකාරයකින් කරනු ලැබුවා වූ ද ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සුරක්ෂිතභාවයට හානිකර වන්නා වූ ද යම් කටයුත්තක් අදහස් වන අතර, ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය, එක්සත් බව හෝ දේශපූර්ණත්වය බිඳ දැමීමට හෝ අනතුරට පාත්‍ර කිරීමට ඉඩ ඇත්තා වූ නැතහොත් එසේ කිරීමට අදහස් කරන්නා වූ යම් සංවිධානාත්මක කටයුත්තක් ද ඊට ඇතුළත් වේ ;

''ප්‍රවෘත්ති පත්‍රය'' යන්නට යම් සංග්‍රහයක්, සඟරාවක්, පත්‍රිකාවක් හෝ වෙනත් ප්‍රකාශනයක් ඇතුළත් වේ ;

"මුද්‍රණාලය" යන්නට මුද්‍රණය, ශිලා මුද්‍රණය හෝ ඡායාරූප ශිල්පය සඳහා හෝ දෘශ්‍යමාන ආකාරයකින් වචන නිරූපණය කිරීමේ හෝ ප්‍රජනනය කිරීමේ වෙනත් ක්‍රමයක් සඳහා පාවිච්චි කළ හැකි යම් යන්ත්‍රෝපකරණයක්, උපකරණයක් හෝ පිරියතක් හෝ ඒ යන්ත්‍රෝප කරණයට, උපකරණයට හෝ පිරියතට හෝ අයත් යම් අච්චු අකුරු කිසිවක් හෝ වෙනත් දෙයක් ඇතුළත් වේ ; තව ද

"සංවිධානය" යන්නට යම් ව්‍යාපාරයක්, සමිතියක්, පක්ෂයක්, සංගමයක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ පුද්ගල කණ්ඩායමක් ඇතුළත් වේ.